ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
தொகைமதிப்பு மற்றும் புள்ளிவிபரத் திணைக்களம்
Department of Census and Statistics

TEL: 011-288 9516 FAX: 011-288 3655 E-mail: rgdeptvsu2011@gmail.com

# මධ්‍ය වාර්ෂික ජනගහනය:

වෙබ් නිකුතුව - 2024 සැප්තැම්බර්

උපත්, මරණ හා සංක්‍රමණය රටක ජනගහනය වෙනස් වීමට බලපාන ප්‍රධාන සාධක වේ. උපත්, මරණ හා සංක්‍රමණය අඛණ්ඩව සිදුවන ක්‍රියාවලියක් බැවින් රටක හෝ කිසියම් භූමි ප්‍රදේශයක ජනගහනය කාලය සමග නිරන්තරයෙන් වෙනස් වීමට ලක්වේ. එසේ හෙයින් සෑම රටකම ජන සංගණනයක් පවත්වා කිසියම් නිශ්චිත මොහොතක් සළකා එම මොහොතේ සිටින ජනගහනය ගණනය කිරීම සිදු කරනු ලබයි. මේ අනුව ශ්‍රී ලංකාවේ අවසන් වරට ජන හා නිවාස සංගණනයක් 2012 වසරේදී පවත්වන ලද අතර 2024 වසරේ අවසන් මාස කිහිපය තුල මීලඟ ජන සංගණනය පැවැත්වීමට කටයුතු කෙරෙමින් පවතී.

අන්තර් සංගණන කාල පරාසය තුල සෑම වසරකම රට තුල සිදුවන උපත්, මරණ හා සංක්‍රමණය පිළිබඳ පරිපාලනමය දත්ත පදනම් කරගෙන මධ්‍ය වාර්ෂික ජනගහනය ඇස්තමේන්තු කරනු ලබයි. මධ්‍ය වාර්ෂික ජනගහනය ඇස්තමේන්තු කිරීම සෑම වසරකම ජූලි 01 වන දිනය පදනම් කොට සිදු කෙරේ. පෙර වර්ෂයේ ජූලි 01 දින සිට අදාළ වර්ෂයේ ජුනි 30 වන දින දක්වා ලියා පදිංචි කල උපත් හා මරණ වල වෙනස (ස්වභාවික වර්ධනය) හා ශුද්ධ සංක්‍රමණයේ එකතුව පෙර වර්ෂයේ මධ්‍ය වාර්ෂික ජනගහනයට එකතු කිරීමෙන් අදාල වර්ෂයේ මධ්‍ය වාර්ෂික ජනගහනය ලබාගත හැක.

**අදාල වර්ෂයේ මධ්‍ය වාර්ෂික ජනගහනය = පසුගිය වර්ෂයේ මධ්‍ය වාර්ෂික ජනගහනය**

**+ උපත් සංඛ්‍යාව - මරණ සංඛ්‍යාව**

**+ රට තුලට පැමිණි සංඛ්‍යාව - රටින් පිටවූ සංඛ්‍යාව**

**ස්වභාවික වර්ධනය = උපත් සංඛ්‍යාව - මරණ සංඛ්‍යාව**

**ශුද්ධ සංක්‍රමණය = රට තුලට පැමිණි සංඛ්‍යාව - රටින් පිටවූ සංඛ්‍යාව**

වගුව 1: වාර්ෂිකව උපත්, මරණ, ශුද්ධ සංක්‍රමණය සහ ජනගහනය වෙනස්වීම 2013 -2024

| කාල සීමාව | වර්ෂය | උපත් | මරණ | ස්වභාවික වර්ධනය | ශුද්ධ සංක්‍රමණය | ජනගහන වෙනස්වීම | මධ්‍ය වාර්ෂික ජනගහනය ('000) |
|---|---|---|---|---|---|---|---|
| 2012 ජූලි සිට 2013 ජූනි දක්වා | 2013 | 352,450 | 125,626 | 226,824 | -71,730 | 155,094 | 20,585 |
| 2013 ජූලි සිට 2014 ජූනි දක්වා | 2014 | 361,800 | 125,334 | 236,466 | -44,714 | 191,752 | 20,778 |
| 2014 ජූලි සිට 2015 ජූනි දක්වා | 2015 | 342,108 | 129,577 | 212,531 | -17,055 | 195,476 | 20,970 |
| 2015 ජූලි සිට 2016 ජූනි දක්වා | 2016 | 331,525 | 129,936 | 201,589 | 34,995 | 236,584 | 21,209 |
| 2016 ජූලි සිට 2017 ජූනි දක්වා | 2017 | 325,512 | 138,582 | 186,930 | 57,028 | 243,958 | 21,453 |
| 2017 ජූලි සිට 2018 ජූනි දක්වා | 2018* | 325,741 | 136,403 | 189,338 | 32,826 | 222,164 | 21,670 |
| 2018 ජූලි සිට 2019 ජූනි දක්වා | 2019* | 329,177 | 141,104 | 188,073 | -54,681 | 133,392 | 21,803 |
| 2019 ජූලි සිට 2020 ජූනි දක්වා | 2020* | 299,875 | 139,203 | 160,672 | -44,160 | 116,512 | 21,919 |
| 2020 ජූලි සිට 2021 ජූනි දක්වා | 2021* | 295,418 | 136,685 | 158,733 | 77,600 | 236,333 | 22,156 |
| 2021 ජූලි සිට 2022 ජූනි දක්වා | 2022* | 289,863 | 179,052 | 110,811 | -85,572 | 25,239 | 22,181 |
| 2022 ජූලි සිට 2023 ජූනි දක්වා | 2023* | 268,920 | 190,600 | 78,320 | -222,715 | -144,395 | 22,037 |
| 2023 ජූලි සිට 2024 ජූනි දක්වා | 2024* | 228,091 | 171,714 | 56,377 | -176,932 | -120,555 | 21,916 |

*යාවකාලිකයි

මූලාශ්‍රය: රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

වගුව 1 අනුව, 2012 ජූලි සිට 2013 ජූනි දක්වා කාලය තුල උපත් 352,450 ක් ලියාපදිංචි කර ඇති අතර එම ප්‍රමාණය 2013 ජූලි සිට 2014 ජූනි කාල සීමාව තුල 361,800 දක්වා වැඩිවී ඇත. 2014 ජූලි සිට 2015 ජූනි දක්වා කාලසීමාව සිට 2016 ජූලි සිට 2017 ජූනි දක්වා ලියාපදිංචි උපත් ප්‍රමාණය ක්‍රමිකව අඩුවීමක් දක්නට ඇති අතර 2017 ජූලි සිට 2018 ජූනි දක්වා කාලසීමාව හා 2018 ජූලි සිට 2019 ජූනි දක්වා කාලසීමා වල පෙර වර්ෂයට සාපේක්ෂව උපත්වල වැඩිවීමක් වාර්තා වී ඇත. කෙසේවුවද, නැවතත් 2019 ජූලි - 2020 ජූනි කාලසීමාවේ සිට 2023 ජූලි - 2024 ජූනි කාලසීමාව දක්වා ලියාපදිංචි උපත් ප්‍රමාණය ක්‍රමිකව අඩුවීමක් දක්නට ඇති අතර ඉතා ආසන්න කාලවකවානුව වන 2023 ජූලි - 2024 ජූනි කාලසීමාව තුල ලියාපදිංචි උපත් ප්‍රමාණය 228,091 ලෙස වාර්තා වී ඇත.

තවද, 2012 ජූලි සිට 2024 ජූනි කාලසීමාව තුල ලියාපදිංචි මරණ සංඛ්‍යාවෙහි ක්‍රමික වර්ධනයක් සිදුවී ඇත. එහෙත් 2022 ජූලි සිට 2023 ජූනි කාලසීමාවට සාපේක්ෂව 2023 ජූලි සිට 2024 ජූනි කාලසීමාව තුල ලියාපදිංචි මරණ සංඛ්‍යාවේ අඩුවීමක් දක්නට ඇත.

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ දත්ත වලට අනුව 2015 ජූලි සිට 2018 ජූනි දක්වා සහ 2020 ජූලි සිට 2021 ජූනි කාලසීමාවන් තුල රටින් පිටවී ගිය සංඛ්‍යාවට වඩා රට තුලට පැමිණි සංඛ්‍යාව වැඩිවී ඇති අතර (ධන ශුද්ධ සංක්‍රමණ) අනෙකුත් කාල සීමාවන් තුල රටින් පිටවී ගිය සංඛ්‍යාව රට තුලට පැමිණි සංඛ්‍යාවට වඩා වැඩි වී ඇත. (ඍණ ශුද්ධ සංක්‍රමණයකි).

2021 ජූලි සිට 2023 ජූනි කාල සීමාව තුල ශුද්ධ සංක්‍රමණය ඍණ  222,715 වන අතර එය 2023 ජූලි සිට 2024 ජූනි කාල සීමාව තුල ඍණ 176,932 කි.

මේ අනුව උපත් වල ක්‍රමික අඩු විම හා රටින් පිටව ගිය ජනගහනයේ වැඩිවීම යන සමස්තය සැලකීමෙන් 2023 වසරට වඩා  2024 වර්ෂයේ මධ්‍ය වාර්ෂික ජනගහනය 120,555 කින් අඩුවී ඇත.

